(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 130.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 ඔක්තෝබර් මස 20 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0723/'10

1\.

ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා යටතේ පිරිසෙයින් වර්ෂයකට වරක් හෝ අපනයන සභාවේ රැස්වීමක මුලසුන දරා තිබේද;

(ii) රජයේ අපනයන ප්‍රතිපත්ති සම්පාදනය සිදු කරන පාර්ශ්වයන් කවරේද;

(iii) එබඳු ප්‍රතිපත්ති සම්පාදනයක් අවසන්වරට සිදු කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එමෙන්ම,

(i) 2009 වර්ෂයේදී සහ 2010 වර්ෂයේදී, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 13 වගන්තිය ප්‍රකාරව මුදල් ප්‍රතිපාදන ලබාදුන් සමාගම්වල නම් සහ එම එක් එක් සමාගමට එක් එක් වර්ෂයේදී ලබා දුන් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2009 සහ 2010 වර්ෂයන්හිදී සෙස් බදු ප්‍රතිපූරණය කිරීමට අමතරව රජය විසින් අපනයන සංවර්ධන මණ්ඩලය වෙත ලබා දුන් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0957/'10

2\.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩමග හන්දියේ සිට වැල්තොට දක්වා මාර්ගය වර්ෂ ගණනාවක සිට අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් දැඩි සේ අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය අයත්වන ආයතනය කුමක්ද;

(ii) මෙම මාර්ගය ගමනාගමනයට සුදුසු ලෙස අලුත්වැඩියා කිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩ කටයුතු ආරම්භකරන දිනය හා අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මුදල් මේ වන විට වෙන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1257/'11

3\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1318/'11

4\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාලුමුවදොර පිහිටි ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය මේ වනවිට එම ස්ථානයෙන් ඉවත්කර තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) දැනට යුද හමුදා මූලස්ථානය පවත්වාගෙන යනු ලබන ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට යුද හමුදා මූලස්ථානයේ කටයුතු සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ස්ථාන කවරේද;

(iii) එම එක් එක් ස්ථානයේ අයිතිකරුවන්ගේ නම්, ලිපිනයන් සහ මාසිකව ගෙවනු ලබන කුලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1435/'11

5\.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0765/'10

6\.

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මිහින් එයාර් ගුවන් සේවය සිය මෙහෙයුම් ආරම්භකළ දිනය, ඒ සඳහා යොදවන ලද ආරම්භක ප්‍රාග්ධනය සහ අද වනවිට ආයෝජනය කර ඇති මුළු ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

(ii) අයවැය ලේඛන මගින් මිහින් එයාර් ගුවන් සේවය සඳහා ලබා දෙන ලද මුදල් ප්‍රමාණයන් සහ එලෙස මුදල් වෙන්කර දෙන ලද දිනයන් කවරේද;

(iii) එම ගුවන් සේවයේ ගිණුම්වලින් කපා හරිනලද මුදල් ප්‍රමාණය සහ එලෙස මුදල් කපා හැරීම සිදුකළ දිනය කවරේද;

(iv) ණය වශයෙන් ලබාදෙන ලද ප්‍රාග්ධනය සහ එලෙස ණය ප්‍රදානය කරන ලද බැංකුවල නම් සහ ණය ප්‍රදානය කරන ලද දිනයන් කවරේද;

(v) වසරකට ණය ක්‍රමක්ෂය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මිහින් එයාර් ගුවන් සේවය මගින් වසරකට ප්‍රවාහනය කරනු ලබන මුළු මගීන් සංඛ්‍යාව සහ භාණ්ඩ ටොන් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වන විට එකී ගුවන් සේවය මගින් වසරකට උපයනු ලබන ආදායම කොපමණද;

(iii) මිහින් එයාර් ගුවන් සේවය ලාභදායී මට්ටමකින් පවත්වා ගෙන යාමට ප්‍රවාහනය කළ යුතුව තිබෙන මගී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

(iv) අද වනවිට එකී ගුවන් සේවය මගින් ප්‍රවාහනය කිරීමට සමත්ව ඇති මගී සංඛ්‍යාව හා භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රජය මිහින් එයාර් ගුවන් සේවය සඳහා කිසියම් බැංකු ඇපකර ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒවායේ වටිනාකම සහ ඒවා ලබාදීමේ අරමුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1258/'11

7.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1276/'11

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව බස් නැවතුම්පළෙහි වහලය සහ අනෙකුත් උපකරණ විනාශ වෙමින් පවතින බවත්;

(ii) එම තත්ත්වය හික්කඩුව ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සංචාරක ව්‍යාපාර වෙත විදේශ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා බාධාවක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බස් නැවතුම්පළ නොපමාව ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) බස් නැවතුම්පළෙහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1343/'11

9.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහරගම නගර සංවර්ධන සැලැස්ම යටතේ, තලවතුගොඩ නගරයේ ඉදිකරනු ලබන හරිත උද්‍යානය සහ ක්‍රීඩා පිටිය සඳහා වෙන් කළ භූමි ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉදිකිරීම් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) මේ වන විට එම ඉදිකිරීම් අවසන් කර තිබේද;

(iv) නොඑසේ නම්, මේ වන විට එම භූමිය කුමන කටයුත්තක් සඳහා භාවිතා කරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ක්‍රීඩා පිටියට හා හරිත උද්‍යානයට වෙන් කළ ඉඩම වෙනත් කටයුත්තක් සඳහා භාවිතා කරන්නේ නම්, හරිත උද්‍යානය සහ ක්‍රීඩා පිටිය සඳහා වෙන් කළ මුදල කුමක් සඳහා භාවිතා කළේ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1436/'11

10\.
ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අග්‍රාමාත්‍යතුමාට මේ වනවිට සිටින උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1064/'11

11\.
ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009, 2010 වර්ෂවලදී සහ 2011 වර්ෂයේ මේ දක්වා ලැබී ඇති සමස්ත ණය සහ ප්‍රදානයන්ගේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් අයුරින් ලැබුණු ණය සහ ප්‍රදානයන් යොදගනු ලැබූ ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් අයුරින් ලබාගත් එක් එක් ණය මුදලට අදාළව,

(i) සියල්ල ඇතුළත් සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

(ii) ණය කාලසීමාව කොපමණද;

(iii) ණය කාලසීමාව අවසානයේදී ගෙවා ඇති සමස්ත පොලිය සහ ණය ගාස්තුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1284/'11

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර - කොළඹ අධිවේගී මාර්ගයේ, මාතර පිවිසුම් ස්ථානය වන ගොඩගම කුඩා නගරයක් වශයෙන් සංවර්ධනය කිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා පවරා ගැනීමට නියමිත භූමියේ වර්ග ප්‍රමාණය කොපමණද;

(iii) එම දේපල වෙනුවෙන් වන්දි ගෙවීමක් සිදු කරන්නේද;

(iv) වන්දිය ගෙවීම මුදලින් සිදු කරන්නේ නම්, එක් පර්චසයක් වෙනුවෙන් ගෙවනු ලබන මුදල කොපමණද;

(v) පවරාගත් නිවාස හා ඉඩම් වෙනුවෙන් නව නිවාස හා ඉඩම් ලබා දෙන්නේ නම්, ඒවා එම ප්‍රදේශයේ ඇතිවන සංවර්ධනයේ ප්‍රතිලාභ පහසුවෙන් ලබාගත හැකි ස්ථානවලින් ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) මේ වන විට ඉඩම් හා නිවාස ලබාදීමට සැලසුම් කර ඇති ප්‍රදේශ කවරේද;

(vii) එම ඉඩම් හා නිවාස අදාළ පුද්ගලයින්ට ලබා දෙනු ලබන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1437/'11

13.

ගරු අජිත් කුමාර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1591/'11

14.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කළුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත්, අගලවත්ත-බදුරලිය ප්‍රධාන මාර්ගය දෙපස ඇති කුඹුරු ඉඩම් ගණනාවක් ගොඩකරමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගය දෙපස ගොඩ කිරීමෙන් පසු ගොඩනැගිලි ඉදිකිරීමට මේ වන විට යොදාගෙන ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා අවසරය ලබා දුන් අය කවුරුන්ද;

(iii) 2000 අංක 46 දරන ගොවිජන සේවා පනත උල්ලංඝනය කරමින් සිදු කරන ඉහත කුඹුරු ගොඩකිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1618/'11

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 මැයි මාසයේ සිට මේ දක්වා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යවරයා / නියෝජ්‍ය අමාත්‍යවරයා යෙදුනු විදෙස් සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචාර සිදුකළ රටවල් කවරේද;

(iii) එම එක් එක් විදෙස් සංචාරයේ අරමුණු හා ලබා ගන්නා ලද ප්‍රතිඵල කවරේද;

(iv) එක් එක් සංචාරය සඳහා සහභාගී වූ නිලධාරීන්, මාධ්‍යවේදීන් හා පුද්ගලික කාර්යමණ්ඩලයේ නිලධාරීන් කවුරුන්ද;

(v) එම සහභාගීවූවන් එක් එක් සංචාරය සඳහා ගමන්ගත් ගුවන් යානයේ පන්තිය හා ඒ සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම සංචාරයන් සඳහා වියදම් වූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව (අංක 1),— ස්ථාවර නියෝග අංක 46 අ (3) (ආ) හි විධිවිධානවල කුමක් සඳහන් වුවද, ගරු කථානායකතුමා විසින් 2011 සැප්තැම්බර් මස 20 වැනි දින "බී" ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරන ලද බස්නාහිර පළාත් කෘෂි සේවා අධිකාරිය ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳව ස්වකීය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා එම ස්ථාවර කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව 2011 නොවැම්බර් මස 30 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය.

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව (අංක 2),— ස්ථාවර නියෝග අංක 46 අ (3) (ආ) හි විධිවිධානවල කුමක් සඳහන් වුවද ගරු කථානායකතුමා විසින් 2011 සැප්තැම්බර් මස 20 වැනි දින "බී" ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරන ලද බස්නාහිර පළාතේ පොලිතීන් භාවිතය පාලනය කිරීමේ ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳව ස්වකීය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා එම ස්ථාවර කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව 2011 නොවැම්බර් මස 30 වැනි දින දක්වා දීර්ඝ කළ යුතුය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජූලි 11 දිනැති අංක 1714/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජූලි 11 දිනැති අංක 1714/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 3),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 අගෝස්තු 12 දිනැති අංක 1718/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 4),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 අගෝස්තු 12 දිනැති අංක 1718/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*11.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*12.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*17.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*18.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*19.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*20.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*21.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

24.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

25.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

26.

ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

27.

රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

28.

දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

29.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**